**N- 25**

# ප්‍රසම්පාදන දැන්වීමයි

## රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

## ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා මිල ගණන් කැඳවීම

කොළඹ 08, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, නො. 118 දරන ස්ථානයේ පිහිටි රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ආපනශාලාව 2026/ 2027 වර්ෂයක කාල සීමාවකට පවත්වාගෙන යාම සඳහා සුදුසුකම්ලත්, මනා ස්ථාවරත්වයක් සහිත, ආපනශාලාවක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (3) ක පළපුරුද්දෙන් යුතු ආයතන හා පුද්ගලයන් වෙතින් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

2. .2026.02.11 දින සිට 2026.03.03 දින දක්වා වූ කාල සීමාවෙහි සාමාන්‍ය රාජකාරී දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ, ලංසු ලියවිලි ගාස්තු වශයෙන් රු.1000.00ක ආපසු නොගෙවනු ලබන අයදුම්පත් ගාස්තුවක් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පරිපාලන ගොඩනැඟිල්ලේ දෙවැනි මහලෙහි සරප් අංශය වෙත ගෙවා ලබාගත් ලදුපත ඉදිරිපත් කර වෙනත් සැපයීම් අංශය වෙතින් අදාළ ලංසු ලියවිලි ලබා ගත හැක.

3. ලංසු අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "2026/ 2027 වර්ෂයක කාලයක් සඳහා ආපනශාලා සේවය සැපයීම" යනුවෙන් සඳහන් කර 2026.03.04 දින ප.ව. 2.00 ට පෙර ලැබෙන සේ සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, නො.118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ වෙනත් සැපයීම් අංශයේ තබා ඇති ප්‍රසම්පාදන පෙට්ටියට බහාලීමට හෝ හැකිය. ලංසු භාර ගැනීම අවසන් වූ විගස 2026.03.04 දින ප.ව. 2.00ට එම ස්ථානයේදීම ලංසු අයදුම්පත් විවෘත කරන අතර ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගී වීමට අවසර දෙනු ලැබේ.

4. පූර්ව ප්‍රසම්පාදන රැස්වීම 2026.02.24 දින පෙ.ව.10.00 ට දෙපාර්තමේන්තු ශ්‍රවනාගාරයේ දී පවත්වනු ලැබේ.

5. මේ පිළිබඳව වැඩිදුර තොරතුරු දුරකතන අංක 011 2673311 මගින් සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (ප්‍රසම්පාදන) වෙතින් විමසීමෙන් ලබා ගත හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
නො.118,
දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 08.

2026.02.11